# ST JOHN AMBULANCE - SRI LANKA
# ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය

## ජාත්‍යන්තර ළමා සංවර්ධන වැඩසටහන
## International Child Development Program

# ST JOHN KITTY
# ශාන්ත ජෝන් කිටි

ශාන්ත ජෝන් ගිලන් සේවයේ ලන්ඩන් ජාත්‍යන්තර මූලස්ථානයේ ක්‍රියාත්මක බැජ්ර් වැඩසටහන අනුව ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා ක්‍රියාත්මක වන්නකි.

## දැක්ම

**ආරම්භයේ සිටම විනය සහ මානුෂිකත්වය**
**යහපත් සංකල්ප තුළින් යහපත් පුරවැසියන්**

## මෙහෙවර

**මානව සංහතියේ සේවය උදෙසා ආකල්ප, කුසලතා හා වටිනාකම් වර්ධනය කරගනිමින්, එදිනෙදා ජීවිතයේදී මුහුණදෙන අවස්ථා, වෙනස්වීම්, අභියෝග වලට සාර්ථකව මුහුණදීම සඳහා ශක්තිමත් පෞරුෂයකින් හෙබි විනයානුකූල හා මානුෂීය ළමා පරපුරක් ගොඩනැගීම, ශාන්ත ජෝන් ගිලන් සේවා කිටි වැඩසටහනේ මෙහෙවරයි .....!**

St John
Sri Lanka


**ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය**
**65/11 , චිත්තපලම් ඒ ගාඩිනර් මාවත , කොළඹ 02.**
011 2437744 011 24176 077 106 4377
email: nhqcommissioner@gmail.com
web: www.stjohnsl.org

# හැඳින්වීම

ශාන්ත ජෝන් ගිලන් සේවය ශ්‍රී ලංකාව තුළ වසර 115කට ආසන්න කාලයක් පුරා ළමා පරපුර වෙනුවෙන් සුවිශාල මෙහෙවරක් ඉටු කරමින් සිටින ස්වෙච්ඡා ආයතනයකි. 1906 සිටම කැඩෙට් වැඩසටහන නමින් වයස අවුරුදු 12 -18 අතර දරුවන් වෙනුවෙන් සාර්ථක වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර 1990 කාලයේ සිට අවුරුදු 6 - 12 අතර කුඩා දරුවන් සඳහා ද ළමා සංවර්ධන වැඩසටහනක් වශයෙන් කිට් වැඩසටහන ක්‍රියාත්මක කරමින් සිටින්නෙමු.

පාසල් පද්ධතියේ ප්‍රාථමික අංශයේ දරුවන් සඳහා ක්‍රියාත්මක මෙම වැඩසටහන තුළින් දරුවන් තුළ මානව දයාව, අනුකම්පාව, සහ පරාර්ථකාමිත්වය ගොඩනැංවීමට උපකාර වන ප්‍රථමාධාර පුහුණුවෙන් ආරම්භ කර නූතන සමාජයේ පවතින සමාජ ගැටළු වලට සාර්ථකව මුහුන දිය හැකි සමබර පෞරුෂ වර්ධනයක් ඇති කිරීම සහ එමගින් සාර්ථක පුරවැසියන් මෙම සමාජයට නිර්මාණය කිරීම අපගේ අපේක්ෂාවයි.

# අරමුණු

* මූලික ප්‍රථමාධාර පුහුනුවක් ලබා දීම.
* ස්වයං විනය ගොඩනැංවීම හා දියුණු කිරීම.
* නායකත්ව පුහුනුව සහ සමාජශීලි බව ගොඩනැංවීම.
* මූලික සෞඛ්‍ය පුරුදු පුහුණු කිරීම.
* සන්නිවේදන හැකියා වර්ධනය සහ නූතන සන්නිවේදන ක්‍රම හඳුන්වා දීම.
* තමා හා අන් අයගේ ආරක්ෂාව තහවුරු කිරීමට දැනුවත් කිරීම.
* සාම්ප්‍රදායික සිතුම් පැතුම්, ජීවන රටා හුරු කිරීම හා අගය කිරීම.
* සාමුහිකව වැඩ කිරීම හා ස්වයං පාලනය හුරු කරවීම.
* පෞද්ගලික හැකියාවන්, දක්ෂතාවයන් වර්ධනය කිරීම හා අගය කිරීම.
* පරිසර හිතකාමිත්වය ගොඩනැංවීම හා පරිසරය සුරැකීමට පෙළඹවීම.
* ළමා වියේ සිටම නිරෝගී දිවි පෙවතකට හුරු කරවීම.

## යහපත් සංකල්ප තුළින් යහපත් පුරවැසියන්

යහපත් දේ ඇසෙන්නට, යහපත් දේ දකින්නට සහ යහපත් දේ අත්විඳින්නට අවශ්‍ය ක්‍රියාකාරකම් සහ පරිසරය, කිට් වැඩසටහන තුළින් ලබා දීම මගින් , යහපත් ළමා මානසික සංකල්ප ගොඩනැංවීම සහ එමගින් යහපත් පුරවැසියන් ශ්‍රී ලාංකීය සමාජයට දායාද කිරීම අපගේ වර්තමාන ඉලක්කයයි.

මෙම වැඩසටහන තවත් දැනුම ලබාදෙන තරග බිමක් නොකර, මානසික සහනය සහ විනයානුකූල ආශ්වාදයන් ලබමින්, ජීවත්වීමට අවශ්‍ය මෘදු කුසලතා ගොඩනගමින්, ස්ථාවර සාර්ථක ජීවිතයක් ගතකිරීමට අවශ්‍ය පන්නරය ලබා දීමේ අත්තිවාරම නිර්මාණය කිරීම අපගේ බලාපොරොත්තුවයි.

**ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය**

ශාන්ත ජෝන් කිටි වැඩසටහන

මෙම වැඩසටහන ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවයේ කිටි වැඩසටහන වසර ගණනාවක් පුරා ක්‍රියාත්මක කළ, සියළුම නිලධාරීන්ගේ දායකත්වයෙන් සකස් කර ඇති අතර කාලීන අවශ්‍යතාවයන් මත මෙම වැඩසටහන වෙනස් කිරීම් වලට ලක් කිරීමට ඉඩ ඇත.

මෙම කරුණු ප්‍රධාන වශයෙන් ලබා ගෙන ඇත්තේ ජාත්‍යන්තර කිටි Badger වැඩසටහන සඳහා නිර්දේශිත විෂය මාලාවෙනි . අපගේ රටට ගැලපෙන පරිදි අවශ්‍ය වෙනස්කම් සිදුකර ඇත. මෙම අත්පොත හුදෙක් මූලික මග පෙන්වීමක් පමණක් වන අතර පාසලේ සහ දරුවන්ගේ පවතින ප්‍රායෝගික තත්වයන්ට අනුකූලවන පරිදි මෙම විෂය මාලාව ක්‍රියාවට නැංවීම වඩාත් යෝග්‍ය වනු ඇත. එසේම මෙම වැඩසටහන තවත් විභාග ක්‍රමයක් බවට පත් නොකර සහභාගිත්වය මත පදනම් වූ ඇගයීම් ක්‍රමයක් යොදා ගෙන පදක්කම් සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

අවම වශයෙන් සතියකට පැය 1 - 2 අතර කාලයක් වැයකළ යුතු අතර වාරයකට එක් පදක්කමක් වශයෙන් වසරකට පදක්කම් 03ක් සම්පූර්ණ කළ හැකිය. වසර 03ක සක්‍රිය සාමාජිකත්වය දරමින් පදක්කම් 09 සම්පූර්ණ කරන සාමාජිකයින් සඳහා Supper Kitty සම්මානය පිරිනමනු ලැබේ.

## 1. ප්‍රථමාධාර කිටි (First Aid Kitty) Badge No: 01

- හදිසි ආධාර (Emergency Aids)
- හුස්ම ගැනීම (Breathing)
- ලේ ගැලීම හා පිළිස්සීම (Bleeding & Circulation)
- අස්ථි (Burns & Scalds)

## 2. ක්‍රීඩාශිලි කිටි ( Games Kitty ) Badge No: 02

- නවීන සහ පැරණි ක්‍රීඩා (New & Cultural Games)
- මාර්ගයේදී ආරක්ෂාව (Road Safety)
- ජලයේදී ආරක්ෂාව (Water Safety)
- ආරක්ෂිත එළිමහන (Outside Safety)

## 3. විනෝදාංශ කිටි (Hobbies Kitty) Badge No: 03

- නිර්මාණාත්මක (Creative)
- ඉදිරිපත් කිරීම (Performing)
- පිටතදි කල හැකි විනෝදාංශ (Outdoor hobbies)
- ගෘහස්ථ විනෝදාංශ (Indoor hobbies)

## 4. ශාන්ත ජෝන් ගිලන් සේවය (St John Kitty) Badge No: 04

- ශාන්ත ජෝන් ගිලන් සේවයේ මුල් යුගයේ තොරතුරු
- බ්‍රිතාන්‍ය හා එතෙර ශාන්ත ජෝන් ගිලන්සේවයේ තොරතුරු
- ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවයෙ මූලික පරිපාලන ව්‍යුහය
- ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවයෙ ක්‍රියාකාරිත්වයන්

## 5. ආරක්ෂක කිට් (Hobbies Kitty) — Badge No: 05

- නිවසේදී ආරක්ෂාව (Home Safety)
- මාර්ගයේදී ආරක්ෂාව (Road Safety)
- ජලයේදී ආරක්ෂාව (Water Safety)
- ආරක්ෂිත එළිමහන (Outside Safety)

## 6. සෞඛ්‍ය කිට් (Healthy Kitty) — Badge No: 06

- ආහාර හා පෝෂණය (Food & Nutrition)
- ඇඳුම් පැළඳුම් (Cloths & Cleanliness)
- පිරිසිදුකම (General Hygiene)
- සෞඛ්‍ය සම්පන්නව සිටීම (Living Healthy)

## 7. සන්නිවේදන කිට් (Communication Kitty) — Badge No: 07

- වාචික සන්නිවේදනය (Verbal)
- ශ්‍රව්‍ය සන්නිවේදනය (Audible)
- දෘෂ්‍ය සන්නිවේදනය (Visible)
- ලිඛිත සන්නිවේදනය (Written)

## 8. සම්පත්පිරි කිට් (Resourceful Kitty) — Badge No: 08

- ගෙවතු වගාව (Gardening)
- ස්වභාව ධර්මය (Nature)
- පරිසරය සුරැකීම (The Environment)
- සමාජයීය සම්පත් (Resources in the community)

## 9. රැකවරණ කිට් (Caring Kitty) — Badge No: 09

- වැඩිහිටියන් රැකබලා ගැනීම (Caring for the elderly)
- ළමයින් රැකබලා ගැනීම (Caring for the young)
- රෝගීන් රැකබලා ගැනීම (Caring for sick)
- සුරතල් සතුන් රැකබලා ගැනීම (Pet Care)

## 10. සුපිරි කිට් සම්මානය (Super Kitty Award ) — Badge No: 10

වසර 03ක සක්‍රිය සාමාජිකත්වය සම්පූර්ණ කර තිබීම.
පදක්කම් 09 සාර්ථකව නිම කර තිබීම්
අනෙකුත් සුදුසුකම් සපුරා තිබීම
නියමිත පරිදි ලිපි ලේඛන මුලස්ථානයට යොමු කර තිබීම.

**සෑම විෂයක් සදහාම පදක්කමක් සහ විෂයන් 03ක් සදහා එක් සහතිකයක් බැගින් සහතික 03ක් ලබා ගත හැකිය.

## කිට් වැඩසටහන ක්‍රියාත්මක කිරීම – පොදු උපදෙස්

1. මෙම වැඩසටහන ක්‍රියාත්මක විය යුත්තේ කිට් දරුවන්හට විනෝදයෙන් කාලය ගත කළ හැකි අකාරයටයි.

2. එක් ගුරුවරයෙකුට නිර්දේශිත කිට්යන් සංඛ්‍යාව උපරිම 25කි. කුඩා දරුවන්ව හැසිරවීම අපහසු බැවින්, මෙම සංඛ්‍යාව අභිබවා නොයා යුතුය. සංඛ්‍යාව වැඩි වන්නේ නම් තවත් ගුරුවරයෙකුගේ හෝ වගකීම් දැරිය හැකි වැඩිහිටියෙකු ගේ සහය ලබා ගත යුතුය.

3. සතියකට දිනක් වශයෙන් පුහුනු වැඩසටහන ක්‍රියාත්මක කළ හැකි අතර එක් දිනකදී වැය කළ හැකි උපරිම කාලය පැය 02කි.

4. එක් දිනකදී විෂය කරුණු කියා දීමට වඩාත් සුදුසු කාලය වන්නේ උපරිම විනාඩි 30කි.

5. වැඩසටහන තුළ ගීත, ක්‍රීඩා සහ වෙනත් විනෝදාත්මක අංශ ඇතුලත් විය යුතුය.

6. දරුවන්හට පහසු පරිදි රූප හෝ අකුරු වලින් සමන්විත සටහන් යොදා පොතක් නඩත්තු කිරීම සෑහේ. මෙම කාර්යය සදහා අනවශ්‍ය ලෙස වියදම් නොකළ යුතුය.

7. සහභාගිත්වය සනාථ කිරීම සදහා නිර්දේශිත පෝරමය ගුරුවරයා විසින් සම්පූර්ණ කළ යුතුය.

8. කිසිම අවස්ථාවක දරුවන් සදහා විභාග නොපැවැත්විය යුතුය.  පදක්කම සදහා 80% ක සහභාගිත්වය සෑහේ.

9. වාරයකට එක් පදක්කමකට වඩා අනුමත නොකරන අතර, පදක්කම් නිකුත් කරන්නේ නියමිත කාලය ගතවු පසුව පමණි ( වාරයකට 01 බැගින් වසරකට 03 ).

10. සෑම විටකම දරුවන්ගේ ආරක්ෂාව පිළිබදව උපරිම සැළකිල්ලක් දැක්විය යුතු අතර, කිට් කණ්ඩායම් භාර නිලධාරීන් ලෙස ප්‍රාථමික ගුරුවරුන් පමණක් යෙදවීමට හේතුවද එයයි.

11. හැකි සෑම විටම දෙමව්පිය කමිටුව හරහා සුදුසු සහය ලබා ගත හැකිය.

12. මෙම අත්පොතෙහි කරුණු අඩංගු කර ඇත්තේ දරුවන්ට ලබා දිය යුතු ආකාරයටම නොවන අතර, ගුරුවරුන්ගේ දැනුම සදහාද කරුණු ඇතුලත් කර තිබේ. ප්‍රාථමික ගුරුවරයෙකුට දරුවන්ට අවශ්‍ය සහ ගැළපෙන ආකාරයට එම දැනුම ලබා දීමේ හැකියාව ඇතැයි අප විශ්වාස කරන්නෙමු.

13. මෙම වැඩසටහන මෙහෙයවීම සදහා අවශ්‍ය අවස්ථා වලදී සුදුසු සම්පත්දායකයින්ගේ සහය ලබා ගත හැකි අතර, එම පුද්ගලයන්ගේ තොරතුරු ඉදිරිපත් කර, විදුහල්පතිගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ. කරුණාකර අධ්‍යාපන අමාත්‍යාංශයේ අදාල චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය.

14. සෑම විටම අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ විදුහලේ නීති රීති ශාන්ත ජෝන් ගිලන් සේවයේ නීති රීති වලට වඩා ප්‍රමුඛවේ.

15. මුලයමය කටයුතු වලදී හැකිතාක් දුරට තනිවම තීරණ නොගෙන, විදුහල්පති සහ දෙමව්පිය කමිටුව සම්බන්ද කර ගැනීම වඩාත් ආරක්ෂා සහිත වනු ඇත. මුලයමය කටයුතු කළ යුතු ආකාරය පිළිබදව අප ආයතනයෙන්ද උපදෙස් මාලාවක් නිකුත් කර ඇත.

16. වැඩි විස්තර සදහා
1 දිස්ත්‍රික් කොමසාරිස්  2 ප්‍රධාන මුලස්ථානය  3 www.stjohnsl.org
4 ප්‍රධාන කොමසාරිස්

**දරුවන් සමග කටයුතු කිරීමේදී සෑම විටම උපකල්පන මත නොව, සිද්ධාන්ත සහ පිළිගත් සම්මත තත්වයන් අනුව පමණක් කටයුතු කරන්න.  එවිට දරවන් පමණක් නොව ඔබවද ආරක්ෂා වනු ඇත. ශාන්ත ජෝන් ගිලන් සේවයේ නිර්දේශයද එයයි.**

**අමතර ක්‍රියාකාරකම් – පදක්කම් වල විෂය මාලාවට අමතරව**

කිටි වැඩසටහන යනු පදක්කම් වල විෂය මාලාවට පමණක් සීමා වු වැඩසටහනක් නොව වයස අවුරුදු 06 - 12 අතර දරුවන්ගේ මානසික සහ චර්යාවන්ගේද සැබෑ සංවර්ධනයක් ගොඩනගන්නාවූ වැඩසටහනකි.

**1 මානසික සංකල්ප ගොඩනැංවීම Developing mental concepts**

වර්තතමානයේ පිළිගත් කරුණක් වන්නේ ළමා වියේ ගොඩනැගෙන මානසික සංකල්ප තුළින් වැඩිහිටියන්ගේ හැසිරීම එළි දකින බවයි. යහපත් මානසික සංකල්ප ගොඩනැංවීමට අවශ්‍ය පරිසරය සැපයීමත් ඒ සදහා අවශ්‍ය ක්‍රියාකාරකම් ලබා දීමත් කිටි වැඩසටහනේ අමතර ඉලක්කයකි. අප මෙම වැඩසටහනේ ක්‍රියාත්මක ව්‍යුහය සකස් කර ඇත්තේ එම ඉලක්කය ද මුල් කරගෙනය.

කිටි වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී සෑම විටම සැළකිලිමත්විය යුතු කරුණක් වන්නේ එතුළින් ළමා මනස තුළ ගොඩනැගෙන සංකල්පය කුමක් විය හැකිද යන්නයි. අප මෙම වැඩසටහන විහාග සහ අනවශ්‍ය තරගකාරීත්වයෙන් ඉවත් කිරීමට හේතුවද මෙලෙස යහපත් මානසික සංකල්ප ගොඩනැංවීමට එවැනි දෑ බාධාවන් වන නිසාය.

**2 යහපත් චර්යාවන් ගොඩනැංවීම Developing good attitudes**

කුඩා වයසේදීම ගොඩනැගිය යුතු මූලික චර්යාවන් ගොඩනැංවීමට ද අප කිටි වැඩසටහන තුළින් උත්සාහ කරන්නෙමු. ඒ අනුව සැළසුමක් අනුව පහත සදහන් චර්යාවන් පුහුනු කිරීමට උත්සාහ ගත යුතුය.

a. ස්තූතියි කීම b. සමාවෙන්න කීම c. කණගාටුයි කීම d. කරුණාකරල කීම

e. ආශිර්වාද කිරීම - ආයුබෝවන් සුභ උදෑසනක් සුභ දවසක් වැනි

f. තමාගේ සීමාවන් තුළ කටයුතු කිරීමට පුහුනුව

g. අනුන්ගේ වාරයේදී ඉවසාගෙගන සිටීමට පුහුනුව

h. පෝළිමක තම වාරය එනතෙක් කලබල නොවී සිටීම

I. අනුන්ගෙන් දෙයක් ඉල්ලා සිටිය යුතු ආකාරය

මෙවැනි චර්යාවන් පුහුනු කිරීම සදහා

a. නියම කරගත් දිනක සිට නැවත නැවත බාවිතා කිරීමට යොමු කිරීම
b. නිසි පරිදි බාවිතා කරන විට ප්‍රශංසා කිරීම/අතපසු වූ විට මතක් කර දීම
c. චිත්‍ර කවි රංගන වැනි අංශ වලින් මෙම චර්යාවන් පිළිබිඹු කිරීම
d. නිවසේදීත් මෙම චර්යාවන් දිරිමත් කරන ලෙස දෙමව්පියන් දැනුවත් කිරීම

**3 ස්වාධීනත්වය ගොඩනැංවීම Independence & self care**

කිටියන්ව අපගේ වැඩසටහන තුළින් ස්වාධීනව තමන්ගේ කටයුතු කරගත හැකි තත්වයට පත් කිරීමට අප උත්සාහ කරන්නෙමු. බොහොමයක් දරුවන් මෙම වයසේදී නිවසින් බැහැරව තනිවම නොසිටි දරුවන්ය.

කිටි නේවාසික කදවුරු පැවැත්වීම තුළින් ස්වාධීනත්වය පහසුවෙන්ම සහ වඩාත් ප්‍රායෝගික ලෙස ගොඩනැංවිය හැකිය. එම නිසා සෑම වසරකම පාහේ පාසල් මට්ටමෙන් දින දෙකක (එක් රැයක්) නේවාසික කදවුරක් පැවැත්වීමට කටයුතු කළ යුතුය.

**4 සමාජශීලිබව ගොඩනැංවීම Socialization & Interpersonal Relationships**

කිටි දරුවන්ව බාහිර පරිසරයට නිරාවරණය කිරීමත් වෙනත් පාසල්වල කිටියන් සමග කටයුතු කිරීමට යොමු කිරීමත් මගින් ඔවුන්ට සමජය සමග ගණුදෙනු කළ යුතු ආකාරය පිළිබදව මනා පුහුනුවක් ලබා දිය යුතුය. විනෝද චාරිකා ආයතන නැරඹීමට යාම වැනි කටයුතු ද මේ සදහා ප්‍රයෝජනවත් වනු ඇත.

## සුපිරි කිටී සම්මානය (Super Kitty Award )

**කිටි වැඩසටහනේ අවසාන මට්ටම සුපිරි කිටි පදක්කමයි. මේ සදහා පහත සදහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය**

**සුදුසුකම් ( 2021 ජනවාරි 01 සිට වලංගුය )**

1. වසර 03ක සක්‍රිය සාමාජිකත්වය සම්පූර්ණ කර තිබීම.
2. සම්මත පදක්කම් 09 සාර්ථකව නිම කර තිබීම.
3. එක්දින කඳවුරු අවම 02 කට සහභාගි වී තිබීම.
4. නේවාසික කඳවුරු අවම 01 කට සහභාගි වී තිබීම.
5. නියමිත පරිදි ලිපි ලේඛන මුලස්ථානයට යොමු කර තිබීම.

**පදක්කම් 09 නිම කිරීමෙන් පමණක් සුපිරි කිටී ලබා ගත නොහැක. අනෙකුත් සුදුසුකම් ද සපුරා තිබිය යුතුය. වසරක් තුළ දෙවතාවක් සුපිරි කිටි අයදුම් පත් කැඳවනු ලැබේ.**

**මැයි ( මැයි 15ට පෙර ) සහ නොවැම්බර් ( නොවැම්බර් 15ට පෙර) මාස වලදී අයදුම් පත් භාරගෙන ජුනි සහ දෙසැම්බර් මාස වලදී සහතික නිකුත් කරනු ලැබේ.**

**කිටි පදක්කම් වලින් සුපිරි කිටි පදක්කම පමණක් කැඩෙට් නිල ඇඳුම සමග පැළඳිය හැකිය.**

## ශාන්ත ජෝන් කැඩෙට් වැඩසටහන (ST JOHN CADET )

**වයස අවුරුදු 12 (06 වසර) වනවිට ශාන්ත ජෝන් කැඩෙට් සාමාජිකත්වය ලබා ගත හැකිය. කැඩෙට් වැඩසටහන සමගින් වයස අවුරුදු 18 ( පාසලින් ඉවත් වන තෙක් ) තෙක් කටයුතු කළ හැකිය. කැඩෙට් වැඩසටහන තුළද විවිධ පදක්කම් ලබා ගත හැකි අතර අවසානයේ සුපිරි කැඩෙට් සම්මානයද ලබා ගත හැකිය.**

**කැඩෙට් සාමාජිකත්වය ලබා ගත් පසු ප්‍රථමාධාර සහ වෙනත් අංශ පිළිබදව ජාත්‍යන්තර මට්ටමේ පුහුනුව සහ සහතික ලබා ගත හැකි අතර මහජන සේවාවන් ලෙස ප්‍රථමාධාර සේවාවන්වල නිරත වීමට ද අවස්ථාව උදාවේ.**

**කැඩෙට් වැඩසටහන තුළින් ජීවිතයට අවශ්‍ය ජීවන කුසලතාවයන් රාශියක් පිළිබදව පුහුනුවක් ලැබෙන අතර එමගින් අනාගතයේ තමන්ගේ ජීවිතය ඉතා සාර්ථක කරගත හැකි වනු ඇත.**

**ශාන්ත ජෝන් කැඩෙට්**

| | |
|---|---|
| 1. ප්‍රථමාධාර පුහුනුව | First aid |
| 2. රෝගී රැකවරණය | Caring for the Sick |
| 3. ජීවන කුසලතා | Life skills training |
| 4. නායකත්වය | Leadership |

**කිටි දරුවන්ව කැඩෙට් වැඩසටහන සදහා සාදරයෙන් පිළිගනිමු**

**ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය**

www.stjohnsl.org




**කිට් දරුවන්ගේ සියළුම පුහුණු හා වෙනත් තොරතුරු මෙම පොතට ඇතුලත් කළ හැකිය**

**මිල රු 100.00 ( 2024 )**




# KITTY BADGES - 09

**විෂයන් 09 සදහා මෙම පදක්කම් පිරිනමනු ලැබෙ**
**වසරකට උපරිම පදක්කම් 03 කි**
**එක් පදක්කමක් සදහා රු 110.00**

St John
SRI LANKA

# ST JOHN AMBULANCE BRIGADE

## KITTY MEMBERSHIP

*This is to certify that*

________________________________________

*has been awarded ST JOHN KITTY membership.*
*Kitty member is entitled to wear kitty uniform & allowed*
*to entertain all the privileges of St John Kitty program*

*awarded membership on:* ____________________

*school :* ________________________________

*membership no :* ____________________________

kitty

Commander
St John Sri Lanka

Commissioner
St John Sri Lanka

St John Ambulance, Sri Lanka - since 1906
www.stjohnsl.org www.stjohnsrilanka.lk

**කිටි සාමාජිකත්වය ලබා ගන්නා විට නිකුත් කරන සාමාජික සහතිකය**
**මිල රු 80.00**

St John
Sri Lanka

The Grand Priory in the
Most Venerable Order of the Hospital of St. John

## The St. John Ambulance Association & Brigade in Sri Lanka

# Kitty (Badger) Award

National Child Development Programme of St. John

This is to certify that

..............................................................................................................

of

..............................................................................................................

has successfully completed the following courses of instruction
and satisfying the standard to warrant the award of the

.............................................................................. Date :..............................

.............................................................................. Date :..............................

.............................................................................. Date :..............................

| Commander<br>St. John Ambulance Brigade<br>Sri Lanka | Commissioner<br>St. John Ambulance Brigade<br>Sri Lanka |
|---|---|

No. 65/11, Sir Chittampalam A Gardiner Mawatha, Colombo - 02. Tel / Fax : 011 2341736 E-mail - nhqcommissioner@gmail.com

68722

**විෂයන් 09 සදහා විෂයන් 03 කට එක් සහතිකයක් බැගින් මෙම සහතික 03 ක් නිකුත් කෙරේ**

**වසරකට උපරිම විෂයන් 03 කි මිල රු 100.00**


St John
Sri Lanka

The Grand Priory in the
Most Venerable Order of the Hospital of St. John

**The St John Ambulance Association & Brigade in Sri Lanka**

National Child Development Programme of St. John

**SUPER KITTY AWARD**

This is to certify that

.............................................................................................

of

.............................................................................................

has done their very best in nine Kitty subjects and now is a

**SUPPER KITTY ( BADGER )**

**WELL DONE**

Commander
St John Ambulance Brigade
Sri Lanka

Awarded on

Commissioner
St John Ambulance Brigade
Sri Lanka

No. 65/11, Sir Chittampalam A Gardiner Mawatha, Colombo - 02.: Tel / Fax : 011 2341736 E-mail - nhqcommissioner@gmail.com

0301

Kitty

**විෂයන් 09 සම්පූර්ණ කර අනෙකුත් සුදුසුකම් සපුරන ලද දරුවන්ට මෙම සහතිකය සහ අදාල පදක්කම පිරි නැමේ   වසර 03ක කිටි සාමාජිකත්වය අනිවාර්යවේ   රු 120.00**






**Kitty Cap 500.00**



# ශාන්ත ජෝන් ගිලන් සේවය ST JOHN AMBULANCE

## කිටි වැඩසටහන අවසානයේ

කිටි වැඩසටහනේ සාර්ථකත්වය රැඳී පවතින්නේ ප්‍රධාන වශයෙන්ම එය මෙහෙයවන කාණ්ඩ භාර නිලධාරී (ප්‍රාථමික ගුරුවරයාගේ) සක්‍රිය දායකත්වය මතය. ශාන්ත ජෝන් ගිලන් සේවය එම කාර්යය ඉතා අගය කොට සලකන අතර සියළුම කාණ්ඩ භාර නිලධාරීන්ටත් අදාල පාසල්වල විදූහල්පති වරුන්ටත් ප්‍රණාමය පුදකර සිටී.

එසේම විවිධ ආකාරයෙන් කිටි වැඩසටහන සාර්ථක කර ගැනීමට සම්පත්දායකත්වය සැපයූ සියළුම නිලධාරීන්ටත් ආයතන වලටත් සියළුම කිටියන් සහ ශාන්ත ජෝන් ගිලන් සේවය වෙනුවෙන් සතුතියත් ගෞරවයත් පුද කර සිටින්නෙමු.

ශාන්ත ජෝන් ගිලන් සේවය අපේක්ෂා කරන්නේ; සියළුම දරුවන් අනාගතයේ ;

යහපත් චර්යාවෙන් යුක්තව, විනයානුකූලවූත් සාර්ථකවූත් ජීවිත ගත කරන පුරවැසියන් වනු දැකීමටයි.

| ST JOHN KITTY | ST JOHN CADET | ST JOHN ADULT | ST JOHN VETERAN |
|---|---|---|---|
| 06 - 11 years | 12 - 18 years | 18 - 65 years | > 65 years |

ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය
වයස අවුරුදු 06 සිට ජීවිතාන්තය දක්වා සාමාජිකත්වය දැරිය හැකිය.

ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය 1906 වසරේ සිට ශ්‍රී ලංකාව පුරා ගෞරවාන්විත වූ සැබෑ ස්වෙච්ඡා සේවාවක් සපයන ආයතනයක් වශයෙන් නිහඬව සේවය සපයා ඇත. අපගේ ශක්තිය සහ අභිමාණය වන්නේ, වැටුප් නොලබා කැපවී, තම කාලය, ශ්‍රමය සහ ධනය පවා වැය කරමින් කටයුතු කරන අප ආයතනයේ ස්වෙච්ඡා නිලධාරීන්ය.

ඉදිරියටත් ශත වර්ෂ ගණනාවක් පුරා ශාන්ත ජෝන් ගිලන් සේවය ළමා පරපුරටත් සමස්ථ සමාජයටත් උතුම් වූ මෙහෙවරක් ඉටුකරමින් බැබලේවා යි යනුවෙන් අප ප්‍රාර්ථනා කරන්නෙමු.
ස්තූතියි.

ප්‍රධාන කොමසාරිස්, ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය.
nhqcommissioner@gmail.com www.stjohnsl.org www.stjohnsrilanka.lk
Mobile / WhatsApp 076 137 8494
Communication Officer ( Brigade ) : 077 106 4377
July 2023 Updated 01.01.2024